

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2023

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
වාර්ෂික වාර්තාව හා ගිණුම්
2023

අන්තර්ගත කරුණු

	අන්තර්ගත කරුණු			පිටුව
	දැක්ම හා මෙහෙවර			**02**
	අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය			05
1.	**සංවිධාන ව්‍යුහය**			07
	(අ)	**පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයින්**		
		i)	කළමනාකාර මණ්ඩලය	08
		ii)	දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	10
		iii)	දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා වන අධ්‍යයන මණ්ඩලය	11
		iv)	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩලයේ සාමාජිකයින්	12
		v)	සේවක වර්ගීකරණය	14
2.	අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය			15
	(අ)	කෙටි හැඳින්වීම		15
	(ආ)	වැදගත් සිදුවීම්හි සාරාංශය		18
	(ඇ)	අභියෝග		25
	(ඈ)	අනාගත සැලසුම්		26
	(ඉ)	පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ශිෂ්‍ය තොරතුරු		26
	(ඊ)	සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු		29
	(උ)	මානව සම්පත්		37
3.	කායී මණ්ඩලය විසින් සිදුකරන ලද පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර			38
4.	තිරසර සංවර්ධනයේ අනාගත අපේක්ෂාවන්			44
5.	විගණන කමිටු වාර්තාව			47
6.	විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ			**48**
7.	විගණකාධිපතිවරයාගේ වාර්තාව			72
8.	විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු			80

දැක්ම

ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි භාෂාව අධ්‍යයනය කිරීමේ සහ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණවල නායකත්වය ඉසිලීම හා දේශීය සහ ගෝලීය අවශ්‍යතා සහ ප්‍රවණතාවලට නිර්මාණාත්මක සහ පසුබිමක් සහිතව පිළිතුරු සපයන ප්‍රමුඛතා වෙනුවෙන් ප්‍රචලිත වීම.

මෙහෙවර

ස්වයං යොමුවක් සහ ස්වයං නිදහස් ඉගෙනීම තුලින් ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනයෙහි පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යයනය, පර්යේෂණ, ගුරු අධ්‍යාපනය, නව සොයාගැනීම් සහ ඉගෙනීමෙහි විශිෂ්ඨතාව සඳහා අවස්ථාව ලබා දීම සහ ජාතික මට්ටමින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යාපනය ඉදිරියට ගෙන යාම සහ ඊට නායකත්වය සැපයීම.

අරමුණ 1 : **ඉංග්‍රීසි භාෂා අධ්‍යනය පිළිබඳ ඉහල ගුණාත්මක භාවයෙන් යුතු පශ්චාත් උපාධි අධ්‍යාපනය සහතික කිරීම**

පරමාර්ථ

1.1 ජාතික අවශ්‍යතා වලට ප්‍රතිචාර දක්වනු ලබන නව්‍ය සහ නවෝත්පාදන වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ලබාදීම

1.2 පවත්නා අධ්‍යන වැඩසටහන් සහ පාඨමාලා ලබාදීමේ ක්‍රමය වැඩි දියුණු කිරීම සහ ගුණාත්මක භාවය පවත්වා ගැනීම

අරමුණ 2: **වඩාත් කාර්යක්ෂම සහ අධීක්ෂණයෙන් යුතු සේවාවක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දීම පිණිස පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම**

පරමාර්ථ

2.1 පරිපාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

2.2 පරිපාලන සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ධාරිතාව සහ නිපුණතාවන් සංවර්ධනය කිරීම

2.3 පරිපාලන ක්‍රියාවලියේදී වැඩිදියුණු කරන ලද තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය

2.4 දත්ත ආරක්ෂා කිරීම සහ **back up** පවත්වා ගැනීම සඳහා පද්ධති සංවර්ධනය කිරීම

2.5 බලශක්තිය පිරිමැසීමට සහ වඩාත් පරිසර හිතකාමීව ආයතනය පවත්වාගෙන යාම සඳහා ආයතනය තුළ හරිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

2.6 වඩාත් කාර්යක්ෂම සහ අධීක්ෂණයෙන් යුතු සේවාවක් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබා දීම සඳහා සහය වීම පිණිස මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම

අරමුණ 3 : **ආයතනයේ පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ධාරිතාව වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම**

පරමාර්ථ

3.1 නවෝත්පාදන පර්යේෂණවල නියැලීම, නිපදවීම සහ ප්‍රචාරණය සඳහා අධ්‍යන කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා වන අවස්ථාවන් ඉහළ නැංවීම.

3.2 අධ්‍යන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

3.3 ශිෂ්‍ය පර්යේෂණ ප්‍රචාරණය සඳහා අවස්ථාවන් සලසා දීම

3.4 ජාතික ප්‍රමුඛතාවන් සඳහා පිළියම් ලබාදීමට උපකාරීවන ආයතනික පර්යේෂණ සිදු කිරීම සහ සංවර්ධනය කිරීම

අරමුණ 4 : ජාතික ප්‍රතිපත්ති සහ සංවර්ධනය සඳහා දායකවන විද්‍යත්මක කතිකාවන්, විවාද සහ ඵලදායී සංකල්ප ගොඩනංවනු ලබන මධ්‍යස්ථානයක් වීම

පරමාර්ථ

4.1 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යන පර්යේෂණ සහ පර්යේෂණ ක්‍රමවේදයන් සඳහා අවකාශයක් සැලසීම සහ ඒ පිළිබඳ ඵලදායී සංකල්ප ප්‍රචලිත කිරීම

4.2 ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යෙහි නියැලී සිටින ප්‍රධාන ආයතන හා ඒකාබද්ධව ජාතික සංවර්ධනයට දායක වීම

අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය



1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා 2005 අංක 4 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනත මඟින් ස්ථාපිත කරන ලද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වෙනුවෙන් කැපවූ එකම පශ්චාත් උපාධි ආයතනය වන අතර, අප ආයතනය විසින් අධ්‍යාපනඥයින් හා වෙනත් වෘත්තිකයින් වෙත ඉංග්‍රීසි භාෂා සහ සාහිත්‍යය පිළිබඳ උසස් මට්ටමේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීමේ ප්‍රමුඛ භූමිකාවක් නිරූපණය කර ඇත. ප්‍රධාන පෙලේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පර්යේෂණ ආයතනයක් වශයෙන් මෙම ආයතනය කීර්ති නාමයක් ගොඩනගා ගෙන ඇත. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ඉගෙනුම ලද ආදි විද්‍යාර්ථීන් සියලු ජාතික විශ්වවිද්‍යාලවලම පාහේ ජ්‍යෙෂ්ඨ තනතුරු උසුලන අතර, බොහෝ දෙනා පිළිගත් විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය සහ වැඩිදුර සුදුසුකම් ලබා ගැනීම සඳහා මෙම ආයතනයේ ශාස්ත්‍රපති උපාධිය ද යොදා ගෙන ඇත.

2013 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සැලකියයුතු මූල්‍ය සහ මානව සම්පත් අභියෝග රැසකට මුහුණපා සිටියදීත්, ආයතනයට සිය ප්‍රධාන පාඨමාලා හතරෙන් තුනක් සහ කෙටි පාඨමාලා දෙකක් ලබා දීමට හැකිවිය. ඊට අමතරව, සිය ශිෂ්‍යයන් මෙන්ම ජාතියේ අවශ්‍යතා වලට පිළියම් යෙදීම සඳහා තොරතුරු හා පර්යේෂණ හුවමාරු සැසි සංවිධානය කරමින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පූර්ව ප්‍රවේශයන් ගනු ලැබ ඇති අවස්ථාවන් පිළිබඳ මෙම වාර්තාව අවධාරණය කරනු ලබයි. කීර්තිමත් ජ්‍යාත්‍යන්තර විද්වතුන් සහ කතිකයින්ගේ සහභාගීත්වයෙන් ආරාධිත දේශන, චිත්‍රපට දර්ශන සහ විචාර මෙන්ම වෙනත් අංගයන් සංවිධානය කිරීම මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ශිෂ්‍ය අත්දැකීම් ඉහල නැංවීමට පියවර ගෙන ඇත.


විදේශ රැකියා සහ විදෙස් සංක්‍රමන සඳහා දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ සුදුසුකම් වලට දැඩි ඉල්ලුමක් පවතින සන්දර්භයක් තුළ, ලෝකයේ ඕනෑම අධ්‍යන හෝ වෘත්තීයමය පරිසරයකට අනුගත වීමට ශ්‍රී ලංකාවේ දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීමේ ආචාර්ය වරුන්ට හැකිවනු පිණිස පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉතා උසස් තත්වයේ, සමාජ සන්දර්භයට සරිලන පශ්චාත් උපාධි සුදුසුකම් අඛණ්ඩව ලබා දෙනු ලබයි.

ආචාර්ය රොමෝලා රසූල්
අධ්‍යක්ෂ
PhD (Melbourne, Australia)
MA (Teachers College, Columbia, USA)
BA (Kelaniya, Sri Lanka)

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2005 ඔක්තෝබර් මස 31 දිනැති ගැසට් අති විශෙෂ ගැසට් නිවේදන අංක 1417/12හි පළ කරන ලද, 2005 අංක 4 දරන ආඥාපනත මඟින් සහ1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් පනවන ලද නියෝගය යටතේ 2005 අංක 4 දරන ආඥාපනත මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථාපිත කරන ලදී.

1. සංවිධාන ව්‍යූහය


විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන කළමනාකාර මණ්ඩලය
විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාව
අධ්‍යයන මණ්ඩල
අධ්‍යක්ෂ
අධ්‍යයන කාර්යමණ්ඩලය
පරිපාලන කාර්යමණ්ඩලය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී
පෙත් තබන්නා
පරිගණක මෙයවුම් සහකාර/ කළමනාකරණ සහකාර
කම්කරු/වැඩ සහායක

(අ)(i) **<u>පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	තනතුරු නාමය
9(1) (අ) අධ්‍යක්ෂ		
1	**ආචාර්‍ය රොමෝල්‍රා රසූල් මහත්මිය** (01.03.2022 – 28.02.2022)	**සභාපති, අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය**
9.1.(ආ) උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම විෂය පැවරිය හැකි එවැනි වෙනත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු.		
2	**පී.යූ.ටී. වරුසවිතාන මහත්මිය** (01.12.2022 – 31.07.2023)	**අධ්‍යක්ෂ, විදේශ අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය**
	සසිකා ලියනගේ මහත්මිය **(01.08.2023 - මේ දක්වා)**	**අධ්‍යක්ෂ, විදේශ අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය**
9.1.(ඇ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව සභාපති;		
3	*ආචාර්‍ය බී.එල්.එම්. අබේවික්‍රම* **මහත්මිය** *(19.05.2023 - 31.12.2023)*	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය**
9.1.(ඈ) විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයනාංශ ප්‍රධානි;		
4	**ආචාර්‍ය එස්.ඒ.ඒ.කේ. සතරසිංහ මහත්මිය** (01.10.2022 – 31.12.2023)	**ප්‍රධානි/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
9.2. (අ) පාලක සභාවේ නියෝජිතයෙකු		
5	**මහාචාර්ය එල්.ආර්.ජයසේකර මහතා** (01.02.2020 - 28.02.2023)	**සම්මානිත මහාචාර්‍ය, පැලෑටි හා අණුක ජීවවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය**
	ආචාර්‍ය එන්.සී. කුමාරසිංහ මහතා (19.05.2023 - මේ දක්වා)	**පාලක සභා නියෝජිත**
9.2. (ආ) කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මහාචාර්යවරු පස්දෙනෙකු හෝ ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සහ වාග්විද්‍යාව (අදාල වන පරිදි) විෂයයන් ඉගැන්වීම භාර අධ්‍යයනාංශ ප්‍රධානීන්		
6	**මහාචාර්ය නෙලූෆර් ද මෙල් මහත්මිය** **(16.01.2023 - මේ දක්වා)**	**ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ප්‍රධානී), කොළඹ විශ්වවිද්‍යාලය**
7	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී.ඩී සේනාරත්න වැත්තෑව මහත්මිය** **(16.01.2023 - මේ දක්වා)**	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය**
8	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නෙලුක සිල්වා මහත්මිය** **(16.01.2023 - මේ දක්වා)**	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය**
9	**මහාචාර්ය එම්. ලලිත් ආනන්ද මහතා** **(16.01.2023 - මේ දක්වා)**	**හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
10	**පී. නාගසුන්දරම් මහත්මිය** **(16.01.2023 - මේ දක්වා)**	**හිටපු ප්‍රධානි, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
9.2. (ඇ) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු		

11	මහාචාර්ය ජී.ආර්.ආර්. රණවක මහත්මිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සෙනට් සභා නියෝජිත, සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සත්ව විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
9.2. (ඇ) අධ්‍යයන මණ්ඩල විසින් සිය සාමාජිකයින් අතුරින් පත්කරගන්නා ලද සාමාජිකයින් දෙදෙනෙකු		
12	ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය/විවෘත විශ්වවිද්‍යාලය සාමාජික - අධ්‍යයන මණ්ඩලය/දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම
13	එම්. අයි. ජෑන්ස් මහත්මිය (16.01.2023 - මේ දක්වා)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
9.2. (ඉ) තාක්ෂණික, අධ්‍යාපනික හෝ පරිපාලනමය ක්ෂේත්‍ර වෙනුවෙන් විශිෂ්ට දායකත්වයක් ලබා දෙන ලද පුද්ගලයින් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු		
14	පී. රනේපුර මහතා (16.01.2023 - මේ දක්වා)	හිටපු ලේකම්, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සහ හිටපු ලේකම්, උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය
15	දේශබන්ධු මහාචාර්ය එම්.ඒ.ඩී.එස්.ජේ.එස්.නිරිඇල්ල මහත්මිය (16.01.2023 - මේ දක්වා)	පොදු හා ජාත්‍යන්තර නීති අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාල
9.2.(ඊ) ගුරු අධ්‍යාපනය නියෝජනය වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් නම් කරනු ලබන අයෙකු		
16	ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ්‍ය, ජාතික අධ්‍යාපන ආයතනය
මහා භාණ්ඩාගාරයේ නියෝජිත		
17	එච්. එම්.සී.කේ. හේරත් මහතා (01.03.2022 - 30.10.2023)	අධ්‍යක්ෂ්‍ය, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය (භාණ්ඩාගාරයේ නියෝජිත)
	කේ.ඒ. රම්‍යා කාන්ති මහත්මිය (20.10.2023 - මේ දක්වා)	කොම්ප්ට්‍රෝලර් ජෙනරාල්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය

(ii) **<u>දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා වන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	තනතුරු නාමය
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්;		
1	ආචාර්‍ය රොමෝලා රසූල් **මහත්මිය**	සභාපති, අධ්‍යක්ෂ/ **පශ්චාද්** උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (2016-03-01 දින සිට)
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුළත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාර කරු;		
2	ආචාර්‍ය අයි. එම්. නවරත්න **මහතා** (2022.11.01 – 2023.09.30) එච්.පී.එස්.ඩී. ගුණසේකර **මහත්මිය** (2023.10.01 – 2023.12.31)	වැඩබලන පුස්තකාලයාධිපති/ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන්;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	ආචාර්ය අග්‍රා රාජපක්ෂ **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	එම්.අයි.ජෑන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු;		
6	එල්.ඩබ්ලිව්.ඩී.බී. පබසරනි මිය	දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පාඨමාලාව
7	පී.එස්. කොඩිප්පිලි ආරච්චි මහත්මිය	එම
12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;		
8	එල්.කේ.කුමාරණතුංග මහත්මිය (2021.04.01 – 2023.07.10)	බාහිර කථිකාචාර්ය/දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (සාමාජික)
	ආචාර්‍ය සුමුදු ඇඹෝගම **මහත්මිය** (2023.07.11 – 2023.12.31)	ප්‍රධානී, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය, සෞන්දර්‍ය කලා විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් නෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		

9	ආචාර්ය පී.එම්.කේ පෙරේරා **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
10	ආචාර්ය එන්.කේ. අබේසේකර **මහත්මිය**	භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත කුමන හෝ කාණ්ඩයකට අයත් නොවන දේශකවරු දෙදෙනෙකු;		
11	ආචාර්ය වී.වී. මැදවත්තෙගෙදර **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (2021-04-01 දින සිට)
12	පී. නානායක්කාර මහත්මිය	හිටපු ද්වීභෂා අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය (2021-04-01 දින සිට)

(iii) **<u>දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්</u>**

	නම	**තනතුරු නාමය**
12. (1) (අ) සභාපතිවරයා බවට පත්වන අධ්‍යක්ෂයාතුමා;		
1	ආචාර්‍ය රොමෝලා රසූල් **මහත්මිය**	සභාපති, අධ්‍යක්ෂ/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ආ) තොරතුරු තාක්ෂණවේදයට අදාල පුස්තකාල හා වෙනත් මාධ්‍ය සම්පත් ඇතුළත් වන, ආයතනයේ ඉගෙනුම් සම්පත් භාරකරු ;		
2	ආචාර්‍යඅයි. එම්. නවරත්න **මහතා** (2022.11.01 – 2023.09.30) එච්.පී.එස්.ඩී. ගුණසේකර මහත්මිය (2023.10.01 – 2023.12.31)	වැඩබලන පුස්තකාලයාධිපති/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඇ) අදාල මණ්ඩලයට හෝ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අධ්‍යයන මණ්ඩලවලට අදාල වන පරිදි ආයතනයේ ස්ථිර ගුරු භවතුන් ;		
3	ආචාර්ය එච්.ඩී.විජේසේකර **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
4	ආචාර්‍ය ආග්‍රා රාජපක්ෂ **මහත්මිය**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
5	එම්.අයි.ජෑන්ස් මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
12. (1) (ඈ) ආයතනයේ ශිෂ්‍යයින් විසින් පත්කරගනු ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු ;		
6	ඩී.ඒ.ඒ. ඩිමන්සි මහත්මිය	ශිෂ්‍ය නියෝජිත (ඉංග්‍රීසි භාෂාව වෘත්තීමය ලෙස හැසිරවීම)

12. (1) (ඉ) ආයතන කාර්යමණ්ඩල සාමාජිකයින් නොවන, ආයතනයට අදාල අධ්‍යයන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ප්‍රකට කළ පුද්ගලයින් අතුරින් අදාල අධ්‍යයන මණ්ඩල විසින් පත් කරගනු ලබන සාමාජිකයින් දෙදෙනෙකු;;		
7	ආචාර්ය ඩී.දේවේන්ද්‍ර මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
8	ආචාර්ය එච්.වී.එම්.රත්වත්තේ මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
12. (1) (ඊ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, මණ්ඩලයේ විෂය පථය යටතට ගැනෙන විෂයයන් උගන්වනු ලබන පුද්ගලයින් දෙදෙනෙකු;		
9	ආචාර්ය පී. මනුරත්න මහත්මිය	ප්‍රධානි/ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
12. (1) (උ) කොමිෂන් සභාවේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් තෝරාගන්නා ලද, ඉහත සඳහන් වර්ගීකරණය යටතට නොගැනෙන ගුරුවරුන් දෙදෙනෙකු ;		
10	ආචාර්යආර්.එම්.සී. ජයතිලක මහත්මිය	ප්‍රධානී / ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

(iv) **<u>පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්</u>**

ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින්

	නම	තනතුරු නාමය
1	**ආචාර්‍ය රොමෝලා රසූල්** මහත්මිය දර්ශනගුරු (ඕස්ට්‍රේලියාව)	**අධ්‍යක්ෂ**
2	**ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා** (2011.11.02 – 2023.05.04) දර්ශනගුරු (හොංකොං)	**මහාචාර්‍ය**
3	**ආචාර්‍ය ආග්‍රා රාජපක්ෂ** මහත්මිය දර්ශනගුරු (Arizona State University)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
4	**ආචාර්‍ය එච්. ඩී. විජේසේකර** මහත්මිය දර්ශනගුරු (QUT, Australia)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
5	**එම්.අයි. ජෑන්ස් මහත්මිය** (දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි බස ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය/ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) දර්ශනපති (කැලණිය)	**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
6	**ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා** MHRM (කොළඹ) සප්ත වාර්ෂික නිවාඩු (2023.05.02 – 2024.05.01)	**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී**

7	**එස්. සී. මුණසිංහ මහත්මිය** ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (කොළඹ)	**සහකාර මූල්‍යාධිකාරී**
8	**ජී.පී.අයි.ඩී. සිරිවර්ධන මහත්මිය**	**කළමනාකාර සහකාර**
9	**එච්.එන්.එන්. පෙරේරා මහතා**	**කළමනාකාර සහකාර**
10	**ඒ.ආර්.එස්.කේ. රාජපක්ෂ මහත්මිය**	**කළමනාකාර සහකාර - පොත් තබන්නා**
11	**ඒ.ජී.ආර්.එම්.ඩී.කේ. රණවීර මහත්මිය**	**කළමනාකාර සහකාර**
12	**ඩබ්ලිව්.එම්.ඩී.ආර්.බී. වීරසිංහ මහතා**	**කම්කරු**
13	**ආර්.යූ. ජයසිංහ මහතා**	**කාර්ය සහායක**

කොන්ත්‍රාත්ගත කායී මණ්ඩල සාමජිකයින්

	නම	තනතුර
1	**ඊ.කේ.එන්. ධර්මරත්න මහතා** ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති (කැලණිය) සප්ත වාර්ෂික නිවාඩු මත (2023.05.01 -2024.05.01)	**නියෝජ්‍ය ලේඛකාධිකාරී**
2	**එස්.සෙනෙවිරත්න මහත්මිය** ශාස්ත්‍රපති (ලන්ඩන් යුනිවර්සිටි කොලීජිය, එක්සත් රාජධානිය)	**කථිකාචාර්ය**
3	**එන්.ටී. විජේගුණවර්ධන මහත්මිය** ශාස්ත්‍රපති (ගිසෙන් විශ්වවිද්‍යාලය, ජර්මනිය)	**කථිකාචාර්ය**
4	**එස්. එල්. රණසිංහ මහත්මිය** විද්‍යාවේදී (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**අධ්‍යයන සම්බන්ධීකාරක**
5	**ටී.ඒ.එන් ද සිල්වා මහත්මිය** තාක්ෂණවේදී (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය)	**අධ්‍යයන සම්බන්ධීකාරක**
6	**බී.එම් කුමානායක මහතා** ශාස්ත්‍රවේදී (ජයවර්ධනපුර)	**ව්‍යාපෘති සහකාර**
7	**ඩබ්ලිව්.ජී.අයි.එම්. හේරත්** **BIS (**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)	**මෙහෙයුම් සහකාර**

සේවක වර්ගීකරණය				
සේවා බාණ්ඩය	වැටුප් කේතය	ඇනුමත සේවක සංඛ්‍යාව	2023/12/31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව	2023/12/31 දිනට පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL - 1	**2**	1	1
ද්විතීයික මට්ටම				
කළමනාකාර සහකාර - ශිල්පීය නොවන	U - MN 1	**5**	**4**	**1**
තෘතීක මට්ටම				
කණිෂ්ඨ විධායක/ කළමනාකාරවරුන්	U - EX 1	**1**	**1**	
ජ්‍යෙෂ්ඨ මට්ටම				
මධ්‍යම මට්ටමේ විධායකයින්	U - EX 2	**1**	**1**	
කථිකාචාර්යවරුන්	U - AC 3	4	3	**1**
අධ්‍යක්ෂක	U - AC 5	1	1	
		14	**1**1	3

2. අධ්‍යක්ෂකවරයාගේ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

2023 වර්ෂය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනට වඩාත් අභියෝගාත්මක වසරක් විය. රට මුහුණ පාන ලද ආර්ථික අර්බුදය හමුවේ බොහෝ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් අනපේක්ෂිත අරමුදල් කපා හැරීම් සිදුකරන ලද අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළද එම තත්වය බලපැවැත්වෙන ලදී. එම ක්ෂේත්‍රය තුළ, පශ්චාද් උපාධි ආයතනවලට මූල්‍යමය වශයෙන් ස්වයංපෝෂිත වීම කෙරෙහි එකී ආයතන උනන්දු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය වේගයෙන් නැඹුරු වීම නිසා විශේෂයෙන් පශ්චාත් උපාධි ආයතන දැඩිලෙස බලපෑමට ලක්විය. මෙම සන්දර්භය තුළ, 2022 වර්ෂය වන විට ඉතා සීමිත අරමුදල් ප්‍රමාණයක් පමණක් ලැබෙමින් පැවති පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට, 2023 වර්ෂය වන විට සම්පූර්ණ මුදල් කප්පාදු කරන බව දැනුම් දෙන ලදී. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය පිරිසෙන් බොහෝමයක් ගුරුවරුන්ගෙන් සහ කණිෂ්ඨ කථිකාචාර්ය වරුන්ගෙන් සම්න්විත වූ හෙයින්, ගාස්තු ව්‍යුහයන් විශාල ලෙස ඉහල නැංවීමකින් තොරව වැඩසටහන්වල ගුණාත්මකභාවය පවත්වාගැනීම අභියෝගාත්මක විය.

මෙම අභියෝගය සම්බන්ධයෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රතිචාරය දෙආකාර විය. එක අතකින් අවම වශයෙන් සිය ස්ථිර කාර්මණ්ඩලයේ වැටුප් ගෙවීම් ආවරණය කිරීම සඳහා හෝ රාජ්‍ය අරමුදල් අඛණ්ඩව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ලැබිය යුතු බවට වාද කිරීම සඳහා සාමූහික ප්‍රයත්නයක යෙදුනු අතර අනෙක් අතට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පිරිනමනු ලබන පාඨමාල වල පරාසය වැඩි කිරීමටත් රටතුළ එහි ප්‍රචාරණය ඉහල නැංවීමටත් විවිද කෙටි හා දිගු කාලීන ක්‍රියාමාර්ග ගන්නා ලදී. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා, අධ්‍යාපන අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ අනෙකුත් බලගතු පාර්ශ්ව සහ ආයතන ඇතුළු විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද අරමුදල් ලබාදීම සාධාරණීකරණයට ස්තූතිවන්නට, වසරේ අවසාන භාගයේ දී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ස්ථිර සේවකයන්ට වැටුප් ගෙවීමට අවශ්‍ය අරමුදල්වලින් ඉතා කුඩා ප්‍රතිශතයක් ලබාගැනීමට හැකිවිය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ වෙනත් ඕනෑම ස්ථිර සේවකයෙකු හා සමානව එම නිර්ණායක යටතේ බඳවා ගන්නා ලද ස්ථිර සේවකයින්ට අවම වශයෙන් වැටුප් ගෙවීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වැඩි අරමුදල් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අඛණ්ඩව බලපෑම් කරයි.

දෙවන ප්‍රතිචාරය වූයේ ප්‍රචාරණය වැඩිකිරීමට ක්‍රියාශීලී පියවර ගැනීම සහ ඒ හරහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ආදායමයි ඉහල නැංවීමයි. ජනතාව මුහුණ දෙන ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ වුවද කෙටි පාඨමාලා දෙකක් පිරිනමා ප්‍රමාණවත් සංඛ්‍යාවක් බඳවා ගන්නා ලදී. හුදෙක් ඉංග්‍රීසි සාහිත්‍යය උගන්වන ගුරුවරුන්ට වඩා වැඩි පිරිසක් ආකර්ෂණය කරගැනීම සඳහා පාඨමාලා විෂය පථය පුළුල් වන පරිදි නවීකරණය කළ යුතු යැයි හැඟුණු හෙයින් මෙම වසර තුළදී දෙවන බස පසුබිමක් තුල සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය පිරිනැමීම සිදුනොකිරීමට තීරණය කරන ලදී. නවීකරණ කටයුතු දැනට සිදුකරමින් පවතින අතර 2024 දී නව පාඨමාලාව පිරිනැමීමට අපි බලාපොරොත්තු වෙමු. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

සිය වෙබ් අඩවිය නැවත නිර්මාණය කරනු ලබන අතර වඩාත් වේගවත්, ප්‍රතිචාරී සහ ආකර්ශනීය වෙබ් අඩවියක් 2024 වසරේ මුල් භාගයේදී දියත් කරනු ඇත.

මේ අතර, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රමුඛතම වැඩසටහනවන, අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA in TESL), 4වන වරටත් පිරිනමනලද අතර ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PPE) සහ ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BE) යන පශ්චාත් උපාධි වැඩසටහන් දෙකේ සිසුන්ද ඔවුන්ගේ අදාළ පාඨමාලා හදාරනු ලබයි.

මූල්‍ය අභියෝග මධ්‍යයේ වුවද, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ප්‍රධාන ක්ෂේත්‍රවල සැලකියයුතු ප්‍රගතියක් ලබා ගනිමින් සිටී. පුරප්පාඩුව පැවති ජ්ෂ්ඨ කථිකාචාර්ය තනතුරක් පිරවීමට අපට හැකිවූ අතර එය වත්මන් ආර්ථික වාතාවරණය තුල ලැබූ ජයග්‍රහණයකි. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ක්ෂේත්‍රයේ පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යභාරය හඳුනා ගනිමින්, අපි පර්යේෂණ සහ පිළිබිඹුව (R&R) ඇතුළත් විධිමත් පර්යේෂණ සැසි අඛණ්ඩව පවත්වන්නෙමු. එහිදී අපගේ ක්ෂේත්‍රයේ නව සහ ආකර්ෂණීය පර්යේෂණවල නියැලී සිටින විද්වතුන්ට ඔවුන්ගේ අධ්‍යන කටයුතු පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යන ප්‍රජාව සමග සාකච්ඡා කිරීමට ආරාධනා කෙරේ. සැසි දෙමුහුන් මාදිලියෙන් පිරිනමනු ලබන බැවින් ඔවුන් ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක් භුක්ති විඳිනු ලබන අතර එමගින් ආයතයේ ප්‍රචාරණද වැඩිවේ.

පොදු ප්‍රවාහනයේ අධික පිරිවැය සැලකිල්ලට ගෙන, ශිෂ්‍ය ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන්, බොහෝ දුරට මාර්ගගත ක්‍රම වේදය හරහා දිවා පාසල් පවත්වා ගෙන යනු ලැබේ. කෙසේ වෙතත්, අවශ්‍ය විටෙක මුහුණට මුහුණ ඉගැන්වීම සහ ඇගයීම සමඟ මාර්ගගත ඉගැන්වීම සම්පූර්ණ කිරීමේ අයිතිය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතු වන අතර, මෙම දෙමුහුන් යාන්ත්‍රණය 2023 දී අපට වඩා යහපත් ප්‍රතිඵල අත්කර දී ඇත.

අභියෝග මධ්‍යයේ වුවද, 2023 වසරේ සිසුන් 125 දෙනෙකුට උපාධි ලබාදීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට හැකිවීම ගැන අපි සතුටු වෙමු. එය මෙතෙක් වසරක් තුළ බිහිකල වැඩිම උපාධිධාරීන් සංඛ්‍යාව වේ. මෙය ආයතනය පිටුපස ඇති බලවේගය වන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ (ස්ථිර සහ බාහිර) සහ පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නොසැලෙන කැප වීමට ස්තූතිවන්ත වන්නට අත්කරගනු ලැබූවකි. ඒ සියලු දෙනාටම මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

රටක් වශයෙන් ශ්‍රී ලංකාව අත්විඳින සමස්ත දුෂ්කරතා හේතුවෙන් ආයතනයේ නුදුරු අනාගතය පිළිබඳ දැක්ම අභියෝගාත්මක වේ. කෙසේ වෙතත්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අතීතයේදී, සිය ශක්තිය සහ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව සනාථ කර ඇති අතර, එය ඉදිරි වසර වලදීද අඛණ්ඩව වර්ධනය කරනු ලබන අතර එය රට තුළ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්ෂේත්‍රයට දායක වනු ඇතැයි මම විශ්වාස කරමි.

සමාලෝචිත වර්ෂය සඳහා වන ශිෂ්‍ය සංඛ්‍යාව සහ මූල්‍ය තොරතුරු පහත පරිදි වේ.

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව)

වර්ෂය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ,ශාස්ත්‍රපති උපාධිය (**TESL**)	දෙවන බස පසු බිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම - ශාස්ත්‍රපති උපාධිය (**TLSC**)	ද්වී භාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (**BE**)	ඉංග්‍රීසි භාෂාව වෘත්තීය මය ලෙස හැසිරවී ම - පශ්චාත් උපාධි ඩිප්ලෝ මාව (**PPE**)	දර්ශන ශූරී	කෙටි පාඨමා ලා	මුළු
2015 (2014/15)	140	14	-	-		64	218
2016 (2015/16)	155	19	-	-		189	363
2017 (2016/17)	176	45	-	-		169	390
2018 (2017/18)	191	56	-	-		60	307
2019 (2018/19)	193	64	40	-		27	391
2019/20	203	75	50	67		45	430
2020/21	285	107	84	45		50	568
2021/22 (2021/12/31 දිනට)	328	121	52	39	3	-	543
2022/23 (2022/12/31 දිනට)	282	113	52	45	2		494
2023/24 (2023/12/31 දිනට)	236	70	46	29	2	34	417

ශිෂ්‍ය ප්‍රතිඵල

වර්ෂය	TESL			TLSC		PPE	BE	මුළු
	PGDip	MTESL	MA	PGDip	MA	PGDip	PGDip	
2018 (2017/18)	02	-	12	-	02	-	-	16

2019 (2018/19)	07	-	17	01	01	-	-	26
2020 (2019/20)	08	-	06	01	03	41	-	59
2021 (2020/21)	16	-	07	02	-	33	29	92
2022 (2021/22)	13	12	15	19	-	25	37	121
2023 (2022/23)	30	19	06	20	02	25	05	107

(ආ) 2023 වර්ෂයේ සුවිශේෂී සිදුවීම්

මෙම කොටස මගින් සමාලෝචන වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ළඟා කරගෙන ඇති සුවිශේෂී ආයතනික ජයග්‍රහණ පිළිබඳ කෙටි සාරාංශයක් ඉදිරිපත් කෙරේ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යසාධනය පිළිබඳ තවත් විස්තරාත්මක සහ වෙන් කළ සංඛ්‍යා දත්ත මෙම වාර්ෂික වාර්තාවේ පසු කොටස්වල දක්වා ඇත.

- කොවිඩ් වසංගතය පැවති කාල සීමාව තුළ සංවර්ධනය කරන ලද පුළුල් ගූගල් පන්ති කාමර ක්‍රමය ආයතනය විසින් අඛණ්ඩව භාවිත කරනු ලබයි. කෙසේ වෙතත්, Zoom බලපත්‍ර මිලදී ගැනීමේ පිරිවැය ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබූ බැවින්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, විවෘත විශ්වවිද්‍යාලය සමඟ සම්බන්ධවී ඉගැන්වීම් සඳහා Zoom ගිණුම් තොග වශයෙන් මිලදී ගෙන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි මාර්ගගත ඉගැන්වීම් අවශ්‍යතා සපුරාලීම සඳහා එමගින් ගිණුම් දහයක් ලබා ගන්නා ලදී. මෙම පියවර පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා සැලකිය යුතු ඉතිරියක් ඇති කිරීමට හේතුවිය. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දැනට ඉගෙනුම ලබන සහ නව සිසුන් වෙත "ousl.lk" ඩොමේනය සහිත ඔවුන්ටම සුවිශේෂී වූ විද්‍යුත් තැපැල් ලිපිනයක් ලැබේ. එකී සුවිශේෂී විද්‍යුත් තැපැල් ලිපිනය භාවිත කර ඔවුන්ට සාකච්ඡා සංසද, බහුවර්ණ ප්‍රශ්න, කෙටි පිළිතුරු ප්‍රශ්න, සමීක්ෂණ, jamboards වැනි බහුවිධ ඇගයීම් ක්‍රම වලට අමතරව ඉතා උසස් මට්ටමේ වීඩියෝ සහ ඕඩියෝ සහ දෘෂ්‍ය මුද්‍රිත අන්තර්ගත මෙම ගූගල් පන්ති කාමර හා සම්බන්ධ විය හැක.

- 2022 දී ආරම්භ කරන ලද මාසික පර්යේෂණ සාකච්ඡා සැසි එනම් පර්යේෂණ සහ පිළිබිඹුව (R&R) හි සාර්ථකත්වය මත, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් 2023 වර්ෂය තුළ තවත් සැසි හයක් පවත්වන ලදී. මෙම සැසි දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලද අතර මේ සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වර්තමාන සහ පැරණි සිසුන්, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාන නිලධාරීන් සහ අනෙකුත් විශ්වවිද්‍යාලවල සහෘදයන්ගේ සහභාගීත්වය ඉහල මට්ටමක පැවතුණි. සැසියේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය ඉගැන්වීමට අදාළ විවිධ ක්ෂේත්‍රවල සමකාලීන පර්යේෂණ ප්‍රවණතා පිළිබඳව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සිසුන්ට හඳුන්වාදීමයි.

2023 වර්ෂයේ පවත්වන ලද සැසිවල විස්තර පහත පරිදි වේ.

මාසය	සම්පත් දායක/ අනුබද්ධ ආයතනය	මාතෘකාව
පෙබරවාරි	ආචාර්ය කෞෂල්‍යා පෙරේරා මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉංග්‍රීසි අධ්‍යනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	Analyzing questioning in Sinhala: An exploration
මැයි	ආචාර්ය මදුභාශිනී දිසානයක රත්නායක මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය	Finding a Research Gap that Suits: How does a Creative Writer become an Academic One?
ජුනි	මිහිරි ජෑන්ස් මහත්මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	A snapshot of first language English speaker identities in Sri lanka
ජූලි	මහාචාර්ය හර්ෂණ රඹුක්වැල්ල මහතා මහාචාර්ය අබුඩාබිහි නිව් යෝක් විශ්වවිද්‍යාලය	The ‘cultural life of democracy’ Some notes on ‘doing’ democracy differently
ඔක්තෝබර්	ආචාර්ය අශානි මැක්ස්වර්ත්, කථිකාචාර්ය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය	Edutaintment ot the rescue? Ensuring Students’ Active Participation in Synchronous Virtual Classrooms
දෙසැම්බර්	ආචාර්ය ශිවනී ඉලංගකෝන් මහත්මිය, ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය	Morphological intergration of borrowings in written Sri Lankan English

- ආයතනය තුළ ශිෂ්‍ය අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා සහ බුද්ධිමය හුවමාරු සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් විවිධ ක්‍රියාකාරකම් සඳහා සත්කාරකත්වය දක්වනු ලැබීය. ඉන් පළමුවැන්න ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය සඳහා වූ නව ඉංග්‍රීසි භාෂා විෂය මාලාව පිළිබඳ තොරතුරු හුවමාරු කිරීමේ සැසියකි. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ ජාතික

අධ්‍යාපන ආයතනය එක්ව සංවිධානය කරන ලද මෙම වැඩසටහන, ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ සහභාගීත්වයෙන් 2023 ජනවාරි 26 වන දින පැවැත්විය. ජාතික අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආචාර්‍ය දර්ශන සමරවීර මහතා මෙම වැඩසටහන සඳහා පහසුකම් සලසන ලද අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ අංශ නියෝජනය කරමින් විද්වතුන් සහ නිළධාරීන් බොහෝ පිරිසක් ඊට සහභාගි විය.

- පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලද තවත් එක් ආකර්ශනීය වැඩසටහනක් වූයේ "Friendship's Death" නම් පර්යේෂණාත්මක චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමයි. ඊට සමගාමීව, චිත්‍රපටයේ නිෂ්පාදක සහ මහාචාර්ය Colin MacCabe මහතා සමඟ සජීවී සාකච්ඡාවක් පැවැත්විණි. මෙම සජීවී වැඩසටහන 2023 පෙබරවාරි මස පවත්වන ලද අතර පේරදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යනාංශයේ මහාචාර්ය අර්ජුන පරාක්‍රම විසින් මෙහෙයවන ලදී.



- 2023 ජූලි මාසයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සංවිධානය කරන ලද මහජන පිළිසඳර මූලික වශයෙන් ඉංග්‍රීසි භාෂාව ව්‍යාත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හදාරන සිසුන් සඳහා "AI, English and the future of work" යන කාලෝචිත මාතෘකාව යටතේ අදහස් දක්වන ලද බහුවිධ නායකත්ව පුහුණුකරුවෙකු සහ උපදේශකයෙකු වන විදූෂ නාතවිතාරණ මහතා විසින් පවත්වන ලදී. මෙම මාතෘකාව සිසුන්ට මෙන්ම කාර්ය මණ්ඩලයට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සජීවී සංවාදයක් ඇති කළේය.
- 2023 ජාත්‍යන්තර විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සම්මන්ත්‍රණයේ (iOURS) පූර්ව සම්මන්ත්‍රණ වැඩසටහන්වල කොටසක් ලෙස මාර්ගගත සැසි දෙකක් සංවිධානය කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ඒකකය හා එකාබද්ධව කටයුතු කරන ලදී. ඉන් පළමුවැන්න වූයේ නිව් යෝර්ක්හි සිටි විශ්වවිද්‍යාලයේ Baruch විද්‍යාලයේ ආචාර්‍ය Brooke R. Schreiber මහතා විසින් සිදුකරන ලද "Insights into the process of international publication

in Linguistics: Q & A session" සැසියයි. දෙවැන්න වූයේ ආඛ්‍යාන විමර්ශනය යන මාතෘකාව යටතේ මහාචාර්ය Gary Barkhuizen මහතා විසින් සිදු කරන ලද සැසියයි.

- ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ උසස් උපාධි පර්යේෂණ අධ්‍යක්ෂ සහ ගුරු අධ්‍යාපන විෂය නිර්දේශ සහ ශික්ෂණ විද්‍යාව පිළිබඳ කථිකාචාර්‍ය, ආචාර්‍ය Simone Smala විසින් මෙහෙයවන ලද "Lessons form Down Under: The Dynamics of Bilingual Education in Australia' නමින් මාර්ගගත වැඩසටහනක් ද පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සංවිධානය කරන ලදී. මෙම උත්සවය ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ කොටසක් ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් සංවිධානය කරන ලදී. ඔස්ට්‍රේලියාවේ ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආචාර්ය ස්මාලාගේ ඉදිරි දර්ශනය අපගේ සිසුන්ට පරිකල්පනීය ශක්තිය වර්ධනය කිරීමට ඉවහල් විය.
- 2023 දී නව දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන ක්‍රියාවට නැංවීමේ සංදිස්ථාන දෙකක් විය. ඉන් පළමුවැන්න නම්, වැඩසටහනේ මූලික පාඨමාලා වලින් එකක් වන පැය 100 ඉගැන්වීමේ ප්‍රායෝගික පුහුණුව, ප්‍රථම වරට 2022/23 කාණ්ඩයම සඳහා මාර්ගගත ක්‍රමය වෙනුවට භෞතිකව පැවැත්වීමයි. මෙම ප්‍රවේශයෙන් අපේක්ෂා කළේ, සිය ඉගැන්වීම් ආයතනයේ භූගෝලීය පිහිටීම නොසලකා, පාඨමාලාවේ සියලුම සිසුන් සඳහා උපදේශන සහ අධීක්ෂණ ක්‍රියාවලිය පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් කේන්ද්‍රීයව සම්බන්ධීකරණය කළ යුතු බවයි.

  දෙවැන්න වූයේ නව දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ 2020/21 කණ්ඩායමේ වඩාත්ම සුදුසුකම් ලත් ශිෂ්‍යයා සඳහා පර්යේෂණ ප්‍රධාන පිරිනැමීමයි. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයහි ප්‍රථම අධ්‍යක්ෂ, සම්මානිත මහාචාර්ය රිහානා රහීම් මහත්මියගේ ප්‍රධානයකට ස්තූතිවන්ත වන්නට මෙම ගෞරවණීය වාර්ෂික මුදල් ත්‍යාගයේ ප්‍රථම ප්‍රථීලාභියා වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශයේ කථිකාචාර්ය සඳරු දිවාකර මහත්මිය වෙත පිරිනමන ලදී.

වැඩසටහන් ආරම්භකිරීම

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් ඉංග්‍රීසි භාෂාව ව්‍යත්තීයමය ලෙස හැසිරවීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා තෝරාගැනීමේ පරීක්ෂණය 2023 නොවැම්බර් 18 වන දින පවත්වන ලදී. අයදුම්කරුවන් 69 දෙනෙකු මාර්ගගත තේරීම් පරීක්ෂණය සඳහා පෙනී සිටි අතර එහිදී මාර්ගගත ප්‍රොක්ටරින් ක්‍රම යොදා ගනු ලැබූ අතර සිසුන්ට හුරු වීම සඳහා පූර්ව පරීක්ෂණ පුහුණු සැසියක්ද පවත්වන ලදී. Google Form භාවිත කරමින් අයදුම්පත් බාරගන්නා ලද අතර, Google පන්ති කාමරය භාවිත කරමින් පවත්වන ලද මාර්ගගත තෝරගැනීමේ පරීක්ෂණයක් සඳහා ශිෂ්‍යයෝ මුහුණ දුන්හ. 2023 දෙසැම්බර් 20 වැනි දින මාර්ගගත ශිෂ්‍ය උපදේශනයක්ද සමගින් වැඩසටහන් සමාරම්භය පවත්වන ලදී. සිසුන් 22 දෙනෙකු වැඩසටහන සඳහා ලියාපදිංචි කරන ලදී. ආයතනික ලෝකයේ පිළිබඳ අත්දැකීම් බහුල නායකයෙකු වන, සේවක අර්ථසාධක අරමුදලේ භිටපු සභාපති ශ්‍රීයාන් ද සිල්වා විජේරත්න මහතා සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරධිත අමුත්තා වශයෙන් සහභාගි විය.



2023 ජූලි මස 08 වන දින පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ප්‍රතිව්‍යුහගතකරන දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහනේ හතරවන කණ්ඩායම සඳහා තෝරාගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී. අයදුම්පත් 137 ක් ලැබුණු අතර විශ්වවිද්‍යාලයේ විභාග ශාලා පරිශ්‍රයේ පවත්වන ලද තෝරාගැනීමේ පරීක්ෂණයට ඔවුන් මුහුණදෙන ලදී. සමාරම්භක සහ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2023 ඔක්තෝබර් මස 05 වැනි දින පවතවන ලද අතර 2023/24 කණ්ඩායම සඳහා සිසුන් 60 දෙනෙකු ලියාපදිංචි වන ලදී. සිසුන් 44 දෙනෙකු වැඩසටහන සඳහා ලියාපදිංචි කරන ලදී. සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරධිත අමුත්තා වශයෙන් ආර්ථික විද්‍යාඥයෙකු සහ ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ මානව සංවර්ධනය සඳහා වන ලෝක බැංකුවේ වැඩසටහනේ ප්‍රධානියෙකු වන ආචාර්ය හර්ෂ අතුරුපාන මහතා සහභාගී විය.





ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනේ **2023** මැයි මාස පැවති සිය සමාරම්භක උත්සවයේදී එහි තුන්වන ශිෂ්‍ය-ගුරු කණ්ඩායම පිළිගනු ලැබීය. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇති කරගන්නා ලද අවබෝධතා ගිවිසුමක කොටසක් වශයෙන් මෙම ශිෂ්‍ය-ගුරුවරුන් **40** දෙනා සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුග්‍රාහකත්වය දක්වන ලදී. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ අධ්‍යාපන අමාත්‍ය

ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතාය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය පී.එම්.සී.නිලකරත්න මහතා ගරු ආරාධිත ලෙස සහභාගී වූ අතර ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ සම්මානිත මහාචාර්ය **Josep Lo-Bianco** මහතා මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රධාන දේශනය පැවැත්වීය.

මීට අමතරව, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යන හා පරිපාලන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

<u>සාමාන්‍ය ශාස්ත්‍රීය කටයුතු</u>

වසර තුළ MA Viva - Voce විභාග දාහතරක් පවත්වන ලදී. ඉන් 11 ක් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා වන අතර 3 ක් දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන සඳහා වේ.

2022 ජනවාරි 05 වැනි දින පැවති උපාධි ප්‍රධානෝත්සවයේදී සිසුන් 125 දෙනෙකු උපාධි ලබා ගත්හ. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පවත්වනු ලබන වැඩසටහන් හතරටම අයත් සිසුන් මෙයට ඇතුළත් වේ.

<u>පරිපාලන කටයුතු හා මූලිකත්වයන්</u>

කොවිඩ් වසංගතය සහ ඉන් පසුව ඇතිවූ දේශපාලන හා ආර්ථික කැලඹීම් හේතුවෙන් සිදුවූ බාධාකාරී තත්වයෙන් අනතුරුව, 2023 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පරිපාලන හා අධ්‍යන කාර්‍ය මණ්ඩලය කාර්‍යාලයේ සාමාන්‍ය වැඩ කරන වේලාවන් වෙත නැවත අනුගත වෙන ලදී.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී 2023.05.02 දින සිට වසරක කාලයක් සඳහා ඔහුගේ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් අතර, මෙම කාල සීමාව තුළ ඔහු වෙනුවට සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයෙකු රාජකාරී ආවරණය කරන ලදී.

2022 මූල්‍ය වාර්තාව 2022 වාර්ෂික වාර්තාව සමඟ පෙබරවාරි 28 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. 2023 වසර සඳහා ගබඩා සහ ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික සත්‍යාපනය ද අවසන් කර ඇත. 2022 වාර්ෂික වාර්තාව 2024 ජනවාරි 16 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

කලින් සඳහන් කළ පරිදි, කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යන පුරප්පාඩු තනතුර වලින් එකක් සඳහා 02.10.2023 දින ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු බඳවා ගැනීමෙන් පුරවන ලදී. තවත් එක් පුරප්පාඩුවක් පවතින අතර මෙය කඩිනමින් පිරවිය යුතුය. එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් ඇයගේ සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයට පර්යේෂණ සාමාජිකාවක් ලෙස සම්බන්ධ විය.

අනධ්‍යයන සේවක මණ්ඩලයේ එක් මාණ්ඩලික සේවකයෙකු වැටුප් රහිත නිවාඩු ලබාගෙන එක්සත් රාජධානියේ රැකියාවක් සඳහා පිටත්ව යන ලදී. කඩිනමින් සම්පූර්ණ කල යුතු අනධ්‍යයන සේවක මණ්ඩලයේ පුරප්පාඩු දෙකක් (පරිගණක යෙදුම් සහකාර 1, කාර්‍ය සහායක 1) පවතින බැවින්, ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමේදී පනවා ඇති සීමාවන් තවදුරටත් අභියෝගයක් වී ඇත.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, ඊට ප්‍රතිචාරයක් වශයෙන්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපදේශකයෙකුගේ සහභාගීත්වයෙන් 2023.12.21 දින ඔවුන් සඳහා එක්දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී. 2024 වර්ෂයේදී මෙම මූලික වැඩසටහන වඩාත් අවධානය යොමු කළ සැසි සමගින් පසුව සිදු කෙරේ.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලය 2023 වර්ෂය තුළ අවස්ථා 11කදී රැස්විය. රැස්වීම් දෙමුහුන් ආකාරයෙන් පවත්වන ලද බැවින්, රැස්වීම්වලට මාර්ගගත ආකාරයට හෝ පුද්ගලිකව පැමිණ ඊට සහභාගි වීමේ අවස්ථාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඉදිරිපත් කරන ලදී. 2023 වසර සඳහා දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම/ද්විභාෂා අධ්‍යාපනය සහ දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම/ ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය ලෙස හැසිරවීම සඳහා වන අධ්‍යයන මණ්ඩලවල රැස්වීම් 10 ක් පැවැත්විණි.

ආයතනයේ බොහෝ ක්‍රියාවලි මැනුවල් ආකාරයට සිදු කෙරෙන බැවින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට කළමනාකරණ තොරතුරු පද්ධතියක (MIS) දැඩි අවශ්‍යතාවයක් පවතී. කෙසේ වෙතත්, එවැනි පද්ධතියක් හඳුන්වා දීම සඳහා වැය වන අධික පිරිවැය සැලකිල්ලට ගෙන, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවතින වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීමට සහ එහි මූලික පියවරක් ලෙස වෙබ් අඩවිය හරහා ගෙවීම් කවුළුවක් හඳුන්වා දීමට අවධානය යොමු කිරීමට තීරණය විය. මේ සඳහා සාකච්ඡා සිදු කෙරෙමින් පවතින අතර 2024 දී වඩාත් ක්‍රියාශීලි නව වෙබ් අඩවියක් දියත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

<u>මූල්‍ය</u>

මෙම වාර්තාවේ සඳහන් කර ඇති පරිදි, 2023 වර්ෂය තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත රාජ්‍ය අරමුදල් සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැත. එබැවින්, එහි ඉතිහාසයේ ප්‍රථම වතාවට, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය වාර්තාවල හිඟයක් පෙන්නුම් කරයි. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම		වියදම	
අයදුම්පත් ගාස්තු	397,000.00	ස්ථිර කාර්‍ය මණ්ඩලය සඳහා වැටුප්	26,851,050.47
ලියාපදිංචි ගාස්තු	464,900.00	කොන්ත්‍රාත් කාර්‍ය මණ්ඩලය සඳහා වැටුප්	9,160,676.34

ඉගැන්වීම් ගාස්තු	13,959,455.00	ගමන් වියදම්	173,988.00
විභාග ගාස්තු	844,315.00	සැපයුම් සහ භාණ්ඩ	753,287.94
පරිපූරක ගාස්තු	314,200.00	නඩත්තු වියදම්	583,885.73
නිබන්ධන ගාස්තු	1,526,800.00	කොන්ත්‍රාත් සේවා	956,610.40
කෙටි පාඨමාලා ගාස්තු	983,336.26	වෙනත් පුනරාවර්තන වියදම්	7,085,241.03
අන්තර්ජාලා ගාස්තු	17,903,721.27	පාරිතෝෂික වියදම්	1,928,448.50
විවිධ ලැබීම්	141,228.01		
	36,170,955.54		
			47,493,188.41

(ඇ) අභියෝග

2023 දී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මුහුණ දුන් බරපතලම අභියෝගය වූයේ අරමුදල් නොලැබීමයි. රාජ්‍යයේ අරමුදල් ලැබීම් ක්‍රමානුකූලව අඩුවෙමින් පැවතියද, 2023 වර්ෂයේදී පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ තවත් පශ්චාත් උපාධි ආයතන කිහිපයක් සඳහා රජය විසින් ලබාදෙනු ලබන අරමුදල් මුළුමනින්ම කපා හරින ලදී. මෙය වසර තුළ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වසර ගණනාවකට පසු පළමු වරට හිඟයක් වාර්තා කිරීමට හේතු විය.

තවත් අභියෝගයක් වන්නේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට අවසර නොදීමයි. ආයතනයක් සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත් සහ බාහිර කාර්ය මණ්ඩලය මත යැපෙන විට ස්ථාවර සහ තිරසාර පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම අභියෝගයකි. මෙම කාර්යමණ්ඩල සාමාජිකයින්ට ගෙවනු ලබන වැටුප් වර්තමාන වෙළඳපොලේ අයදුම්කරුවෙකු සතු සුදුසුකම් වලට වඩා අඩු බැවින්, කාර්ය මණ්ඩලයේ ඉහළ පිරිවැටුමක් නොමැති අතර එය ආයතනයට හිතකර නොවේ.

රජයේ මෙම මූල්‍ය හා මානව සම්පත් සම්බන්ධ තීරණවල ප්‍රතිවිපාක අහිතකර වේ. සිය අනාගතය සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාව හේතුවෙන්, අධ්‍යයන සහ අනධ්‍යයන යන දෙඅංශයෙන්ම සමන්විත ස්ථීර කාර්යමණ්ඩලය අධෛර්යයට පත්ව ඇත. විභව අපේක්ෂකයින් මෙම අවිනිශ්චිතතාවයට මුහුණ දීමට පැකිලීම හේතුවෙන් ස්ථීර පදනමින් දක්ෂ අධ්‍යන නිළධාරීන් ආකර්ෂණය කරගැනීම පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට ගැටලුකාරී වී ඇත.

අනෙක් අතට දැනට පවතින පාඨමාලා සංඛ්‍යාව වැඩි කිරීමට සහ පවතින පාඨමාලාවල සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම මගින් දැනට සිටින කාර්යමණ්ඩලයට නිරන්තර පීඩනයට ලක්වේ. කුඩා අධ්‍යන නිළධාරීන් පිරිසක් සිටින බැවින්, ගුණාත්මක භාවය අඩු නොකර මෙය සිදු කිරීම පහසු නොවනු ඇත.

ජනතාව මුහුණ දෙන වත්මන් ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගෙන, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ද සිසුන්ගෙන් අය කරන ගාස්තු (සාම්ප්‍රදායික වාර්ෂික වැඩිවීම හැර) වැඩි

කිරීමට මැලිකමක් දක්වයි. රටෙහි සුවිසල් කාර්‍ය වපසරිය තුළ අපගේ කාර්යභාරය පිළිබඳව අපි දැනුවත්ව සිටින අතර, එබැවින් අපගේ අධ්‍යාපනයට ප්‍රවේශය හැකි තරම් දැරිය හැකි මට්ටමක තබා ගැනීමට ඇපි කැප වී සිටිමු.

(ඈ) අනාගත සැලසුම්

වර්තමානයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් මුහුණපානු ලබන මූල්‍ය අවහිරතාවන් තිබියදී, ආයතනයට සිය පද්ධතිවල අවශ්‍ය වෙනස්කම් සිදු නොකර වේගවත්, නිවැරදි සහ තිරසාර ආකාරයකින් සිය සිසුන්ට සහාය විය නොහැකි බව වඩ වඩාත් පැහැදිලි වේ. එබැවින් අනාගතයේදී ආයතනයට නවීන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.

තවද, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ/දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ වෙළෙඳපොළ තුළ සමකාලීන අවශ්‍යතා සපුරාලන පාඨමාලා සැලසුම් කිරීම මගින් ආයතනය පිරිනමන කෙටි කාලීන පාඨමාලාවලට එකතු කිරීමට පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය බලාපොරොත්තු වේ. ආයතනය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය වැනි ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ සේවා සපයන්නන් සමඟ සහයෝගයෙන් ජාත්‍යන්තරව පිළිගත් පාඨමාලා ලබාදීමේ ක්‍රම ගවේෂණය කිරීමට බලාපොරොත්තු වේ.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අපේක්ෂා කරන තවත් විකල්පයක් වන්නේ ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට විදේශයන්හි සිටින අය සඳහා ආරාධනා කිරීමේ හැකියාව සොයා බැලීමයි. පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය විසින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා මාලදිවයිනේ ශිෂ්‍ය-ගුරුවරුන්ට ඇතුළත් කර ගැනීමට හැකියාවක් පවතින බව හඳුනාගෙන ඇති අතර මෙම හැකියාව ඉදිරි වර්ෂයේදී තවදුරටත් විමර්ශනය කිරීමට නියමිතය.

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙහි පළමු ජාත්‍යන්තර සමුළුව සංවිධානය කිරීමට ද සැලසුම් සකස් කරමින් පවතී. මෙම සමුළුව 2024 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතය.

(ඉ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවත්වන පාඨමාලා හා ශිෂ්‍යයින්ගේ විස්තර

පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මගින් පිරිනමන අධ්‍යාපනික වැඩසටහන්වල සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් හා මෙම පාඨමාලා සඳහා බඳවාගෙන ඇති ශිෂ්‍යයින්ගේ සංඛ්‍යා දත්ත පහත සඳහන් පරිදි වේ:

පූර්ණ කාලීන පාඨමාලා

අ. පර්යේෂණ මගින් සිදු කරන පශ්චාත් උපාධි පාඨමාලා

1. දර්ශනශූරී උපාධිය
2. දර්ශනපති උපාධිය

ආ. පාඨමාලා සහ පර්යේෂණ අංගද ඇතුළත් පශ්චාත් උපාධි

3. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
4. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන්

1. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
2. දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3. ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
4. ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව

වැඩසටහන	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව
දර්ශනශූරී උපාධිය	2
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TESL)	86
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (M in TESL)	-
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - නව	140
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ශාස්ත්‍රපති උපාධිය (PG Dip./MA in TESL) - පැරණි	10
දෙවන බස පසුබිමක් තුළ සාහිත්‍යය ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA in TLSC)	70
ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDip. in BE)	46
ඉංග්‍රීසි භාෂාව වෘත්තීයමය වශයෙන් භාවිත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	29
ගුණාත්මක දත්ත විශ්ලේෂණය පිළිබඳ කෙටි පාඨමාලාව්	15
අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම් විෂය නිර්දේශය (දනට සිදුකෙරෙන) මගින් ගුරුවරුන්ගේ ධාරිතාව ඉහල නැංවීම	19
මුළු එකතුව	**417**

